GMOA
ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

28-11-2011

**වෛද්‍ය සභාවේ ස්වාධීනත්වයට රැකගනිමු.**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට දිගින් දිගටම සිදුකරනු ලබන විවිධාකාර බලපෑම් මෑතකාලය තුලදී මැනවින් දැකගත හැකි විය. වෛද්‍ය සභාවේ ලේකාධිකාරී වෛද්‍ය එම්.ජේ. නොනිස් මහතාට පහර දීමට තරම් ඒවා දුරදිග ගිය අයුරුත් ඒ සම්බන්දව කිසිදු සැකකරුවෙකු මේ දක්වා අත්අඩංගුවට පත් වී නැති ආකාරයත් කනගාටුවෙන් යුතුව පෙන්වා දෙමු.

වෛද්‍ය සභාවේ සභාපති මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මිය සිය ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය මේ වන විටත් ඉදිරිපත් කර ඇති බවත් ඒ වෙනුවට එම තනතුර සඳහා විවාදාත්මක චරිතයන්ගෙන් හෙබි වෛද්‍ය ක්ෂේත්‍රය තුල ගැටළු ඇති වීමට හේතුවන පුද්ගලයන් එහි සභාපති එම තනතුරට පත්වීමට යන බවත් දැකගන්නට ලැබී ඇත.

එපමණක් නොව වෛද්‍ය සභාව රාජ්‍ය ව්‍යවසායකයක් ලෙස සලකා කටයුතු කිරීමට උත්සහ ගන්නා අයුරු ද දක්නට ඇත.

වෛද්‍ය සභාව යනු වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කරන ස්වාධීන ආයතනයක් මිස දේශපාලන පත්වීම් ලබා දෙන ආයතනයක් නොවන බව අප පෙන්වා දෙමු.

රටේ ජනතාවට හිමිවන වෛද්‍ය සේවයේ ප්‍රමිතිය ආරක්ෂා කරන වෛද්‍ය සභාවේ ස්වාධීනත්වය හා වෘත්තිය ගරුත්වය රැකදෙන මෙන් අප රජයෙන් උදක්ම ඉල්ලා සිටිමු.

වෛද්‍ය සභාවේ ස්වාධීනත්වය හා වෘත්තිය ගරුත්වය රැක ගැනීම සඳහා වෛද්‍ය ක්ෂේත්‍රයේ සියලු පාර්ශවයන් සමග එක්ව කටයුතු කිරීමටත් ඒ වෙනුවෙන් කවර ආකාරයෙන් වුවද විරෝධය දැක්වීමටත් අප පසුබට නොවන බව අවධාරනය කරමු.

ස්තුතියි

for

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්